සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 8 - 2017

නම/විභාග අංකයඃ-.............................. පුරවැසි අධ්‍යාපනය කාලයඃ-පැය 02යි

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

01. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් මෙන්ම ........................................................ ක්‍රමයක් ද වේ.

(සමාජ/ජීවන/ආණ්ඩු)

02. පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් ලෙස ........................................ දැක්විය හැකිය.

(සාමකාමී බව/සමානාත්මතාව/එකමුතු බව)

03. පවුල හැරුණු විට දරුවෙකුට වඩාත් සමීප විය යුතු වන්නේ ...................................................... යි.

(පන්සල/පාසල/සමවයස් කණ්ඩායම)

04. මිනිසුන්ට වඩා ඉක්මනින් .................................... පරිසරයේ වෙනස්කම් හඳුනා ගැනීමට හැකියාව පවතී.

(සිවුපාවුන්ට/සතුන්ට/පක්ෂීන්ට)

05. මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා ගත හැකි වැදගත්ම ක්‍රියාමාර්ගය වන්නේ රියදුරන් මෙන්ම ........................... ද මාර්ග නීති හොඳින් පිළිපැදීමයි.

(මිනිසුන්/පදිකයින්/මගීන්)

- අංක 06 සිට 10 දක්වා වගන්ති හරිනම් (4) ලකුණ ද වැරදි නම් (5) ලකුණ ද වරහන තුළ යොදන්න.

06. තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටුකිරීම පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි. (      )
07. ශ්‍රේෂ්ඨ නායකත්වය යනු අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් නොවේ. (      )
08. වර්තමානයේ බොහෝ රටවල ක්‍රියාත්මක වන පාලන ක්‍රමය වන්නේ ලිබරල්වාදී පාලන ක්‍රමයයි. (      )
09. ශ්‍රී ලංකාව, ඉන්දියාව, බ්‍රිතාන්‍ය යන රටවල් බහු සංස්කෘතික සමාජ පවතින රටවල් වේ. (      )
10. අධික වැසි සහිත කාලවලදී අකුණු ගැසීම නිසා අනතුරු හා විපත් සිදු වුවද එවැනි අවස්ථාවක ජංගම දුරකථන භාවිතා කිරීමට කිසිදු බාධාවක් නැත. (      )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A



11. A පින්තූරයෙන් දැක්වෙන ස්ථානය නම් කරන්න.


.................................................

12. එම ස්ථානය හා සම්බන්ධ වැදගත් සිදුවීමක් වන්නේ

..................................................................................... ප්‍රමුඛ ධර්ම දූතයාණන් වහන්සේලාගේ වැඩම වීමයි.

13. බෞද්ධ උත්සව අතුරෙන් ................................................ උත්සවය ඒ හා බැඳුණු උත්සවයකි.

**B**



14. B පින්තූරයෙන් දැක්වෙන්නේ .................................... සංස්කෘතියට අයත් චාරිත්‍රයන්ය.

15. එම සංස්කෘතිය හා බැඳුණු ප්‍රධාන උත්සව දෙකක් වන්නේ ............................................................ හා ............................ උත්සවයි.

**I අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. පොදු ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවරක් වන්නේ
    - (1) මාර්ග නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම
    - (2) පරණ බස් රථ ධාවනයට එක් කිරීම
    - (3) පෞද්ගලික බස් සේවා සීමා කිරීම
    - (4) නව දුම්රිය මාර්ග ඉදි කිරීම

17. අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරන ආයතනයක් වන්නේ මින් කුමක් ද?
    - (1) මාධ්‍ය ජාල
    - (2) ප්‍රජා සත්කාර ආයතන
    - (3) රතු කුරුස සංවිධානය
    - (4) පෞද්ගලික රෝහල්

18. ඔබ වෙනුවෙන් පොලීසියෙන් සිදුවන සේවාවක් වන්නේ මින් කුමක්ද?
    - (1) අපරාධ කරුවන් අල්ලා ඔවුනට දඬුවම් පැමිණවීම
    - (2) මහජන ආරක්ෂාව සැපයීම
    - (3) මාර්ග ආරක්ෂාව සුරක්ෂිත කිරීම
    - (4) පොදු දේපල ආරක්ෂා කිරීමට නීති පැනවීම

19. සුනාමි තත්ත්වයක් යටතේ ඇතිවිය හැකි හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?
    - (1) සෙසු අය දැනුවත් කිරීම
    - (2) සියලු බඩු බාහිරාදිය රැගෙන නිවසින් පිටවීම
    - (3) නිවසේ වහලයට නැගීම
    - (4) දොරගුලු ලා ආරක්ෂිතව නිවස තුළට වී සිටීම

20. ඖෂධ භාවිතයේ දී සැලකිය යුතු කරුණක් වන්නේ මින් කුමක් ද?
    - (1) තමාට සුදුසු ඔසුහලකින් ඖෂධ ලබා ගැනීම
    - (2) තම රෝගී තත්ත්වයට අදාල ප්‍රතිජීවක ලබා ගැනීම
    - (3) ඖෂධ ශීතකරණයක ගබඩා කර තැබීම
    - (4) කල් ඉකුත්වීමේ දිනය පිළිබඳ සැලකිලිමත් වීම

(ලකුණු 2 5 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව මුළු ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.
- II පත්‍රය සඳහා වෙනම කොළයක් භාවිත කරන්න.

**පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් හිමිවේ. (2 5 8)**

01. (i) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවා 2ක් දක්වන්න.

(ii) ජලය සියලුම ජීවීන්ගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සම්පතකි ජලය. ජලය අපිරිසිදු වන අවස්ථා 2ක් සඳහන් කරන්න.

(iii) පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතන දෙකක් ලියන්න.

(iv) පවුලේ සාමාන්‍ය කටයුතුවලදී මව/පියා හා දරුවන් සාමූහිකව සාකච්ඡාකර ගනු ලබන තීරණ දෙකක් ලියන්න.

(v) එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් හඳුන්වා දී ඇති ළමා අයිතිවාසිකම් 2ක් ලියන්න.

(vi) අයහපත් චිත්තවේග හසුරුවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 2ක් ලියන්න.

(vii) නායකත්ව ලක්ෂණ, පවුල පාසල හා සමාජය තුළ දක්නට ලැබේ. පවුල තුළ නායකත්වය දරන පුද්ගලයන් දෙදෙනෙක් ලියන්න.

(viii) බහු සංස්කෘතික සමාජයක විවිධ ජන වර්ග ජීවත් වෙයි. එසේ ජීවත්වන ජන වර්ග දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2 5 8 = 16)

02. (i) අධ්‍යාපනය ලැබීම, නිසිරැකවරණය ලැබීම යන අයිතිවාසිකම් හා බැඳුණ යුතුකම් දෙකක් ලියන්න. (ල. 02)

(ii) ළමා අයිතිවාසිකම් ආරක්ෂාකිරීම සඳහා පිහිටුවා ඇති ආයතන 3ක් නම් කරන්න. (ල. 03)

(iii) (අ) ප්‍රාදේශීය මට්ටමින් දරුවන් හා පවුල් සඳහා සේවය සපයන රජයේ නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)

(ආ) එම රජයේ නිලධාරීන් විසින් සපයන සේවාවන් 2 බැගින් ලියන්න. (ල. 04)

03. (i) චිත්තවේග ඵලදායීව හසුරුවා ගැනීම සඳහා පුරුදු පුහුණු කළයුතු ගුණාංග 3ක් ලියන්න. (ල. 03)

(ii) ඔබට චිත්ත පීඩාවක් දැණුනු අවස්ථාවක් සඳහන් කර එම පීඩාව මඟ හරවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග 2ක් ලියන්න. (ල. 03)

...ශවලට ගැළ... ඉදිරියේ ඇති



(1)



(2)



(3)



(4)



(5)

(i) අයහපත් චිත්තවේග හටගන්නා පුද්ගල හා පරිසර තත්ත්වයන් වෙනස් කිරීම ..........................................................

(ii) නිර්මාණකරණය සඳහා යොමුවීම...........................................................................

(iii) මනස සන්සුන් කිරීම ..............................................................................

(iv) ක්‍රීඩා කටයුතු හා ශාරීරික ව්‍යායාම් ............................................................................

(v) මිතුරන් ඇසුරු කිරීම ....................................................................... (ල. 05)

04. (i) නායකයෙකු සතු විය යුතු ගුණාංග 3ක් ලියන්න. (ල. 03)

(ii) පහත දැක්වෙන නායකත්ව ශෛලීන් ඇසුරු කරගෙන අදාල වගුව සම්පූර්ණ කරන්න.

- පොදු ජනතා අදහස් පිළි නොගැනීම
- වෙනස් වීමට කැමති නොවීම
- වැරදි පූර්වාදර්ශ ප්‍රදර්ශනය කිරීම
- පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම
- තර්ජනය කිරීම බිය ගැන්වීම
- ඉතා දැඩිව ක්‍රියා කිරීම
- සොරකම් කටයුතුවල නියැලීම
- පොදු දේපල අයුතු ලෙස පරිහරණය

| ඒකාධිපති නායකත්ව ශෛලිය | දූෂිත නායකත්ව ශෛලිය |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |

(ලකුණු 8)

05. (i) බහු සංස්කෘතික ජන සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ 3ක් ලියන්න. (ල. 03)

(ii) විවිධ ආගම් හා බැඳුණු ආගමික උත්සව ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. එක් ආගමකට උත්සව 2 බැගින් ලියන්න.

| | | |
|---|---|---|
| ආගම | උත්සව | |
| බෞද්ධ | 1. ............................................ | 2. ................................................ |
| හින්දු | 1. ............................................ | 2. ................................................ |
| ක්‍රිස්තියානි | 1. ............................................ | 2. ................................................ |
| ඉස්ලාම් | 1. ............................................ | 2. ................................................ |

06. (i) පෘථිවියේ හා ඒ අවට පරිසරයේ ඇතිවන ස්වාභාවික විපත් 3ක් ලියන්න. (ල. 03)

(ii) ඉන් එක් විපත් තත්ත්වයක් ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් 3ක් ලියන්න. (ල. 03)

(iii) (අ) ආපදා අවස්ථාවකදී දනුම් දිය යුතු ආයතන 3ක් ලියන්න. (ල. 03)

(ආ) ප්‍රජාවගේ අවශ්‍යතා සපුරා ලීමට ජල සැපයුම ප්‍රමාණවත් නොවන විට ඇතිවන ගැටලු 2ක් දක්වන්න. (ල. 02)


07. පහත දක්වෙන උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

**පහළට**

1. ඉස්ලාම් භක්තිකයන්ගේ සංස්කෘතික උත්සවයකි.
4. ඇමෙරිකාවේ භාවිත කරන භාෂාවකි.
6. අනතුරු හා ආපදාවලදී සහය ලබාගත හැකි ආයතනයකි.
7. මේවා විනාශ කිරීම සුනාමි තත්වයක් ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකමකි.
8. ආහාර විෂවීමට බලපාන සාධකයකි.
10. කෝපය නමැති චිත්ත වේගය නිසා ඇතිවන ප්‍රතික්‍රියාවකි.

**හරහට**

2. ඉන්දියාවේ ජීවත්වන ජන වර්ගයකි.
3. අනතුරු හා ආපදා සිදුවන ස්ථානයකි.
5. ඇමෙරිකාවේ ජීවත්වන ජන වර්ගයකි.
9. ඇමෙරිකානුවන් අදහන ආගමකි.
11. ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු ගුණාංගයකි.




(ලකුණු 11)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

## පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | ජීවන | 2. | සමානාත්මතාව | 3. | පාසල | 4. | සතුන්ට |
| 5. | පදිකයන් | 6. | 3 | 7. | 4 | 8. | 5 |
| 9. | 4 | 10. | 5 | 11. | මිහින්තලය | 12. | මිහිඳු හිමියන් |
| 13. | පොසොන් | 14. | හින්දු | 15. | තෛපොංගල්/දීපවාලි | 16. | (i) |
| 17. | (ii) | 18. | (iii) | 19. | (iii) | 20. | (i) |

(ල. 2 5 20 = 40)

### II කොටස

01. (i) ප්‍රවාහන, තැපැල් හා විදුලි පණිවිඩ, බැංකු සේවා
 (ii) කෘමිනාශක එකතුවීම, අපද්‍රව්‍ය එකතුවීම වැනි පිළිතුරු
 (iii) පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වනජීව දෙපාර්තමේන්තුව
 (iv) ආහාරවේල් තෝරා ගැනීම හා සැකසීම, නිවස පිරිසිදුව තබා ගැනීම, විවේකය ගත කිරීම හා විනෝදය
 (v) අධ්‍යාපනය ලැබීම, අපේක්ෂාව ලැබීම
 (vi) ගමන් බිමන් යාම, නිර්මාණකරණය, භාවනා කිරීම යනාදී
 (vii) මව, පියා, වැඩිමහල් සහෝදර සහෝදරියන්
 (viii) සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර් (ල. 2 5 8 = 16)

02. (i) අධ්‍යාපනය නිසි ලෙස ලැබීම, ආරක්ෂා වීම, නීති පිළිපැදීම.. වැනි (ල. 2)
 (ii) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව, ළමා කාන්තා කාර්යාංශය, ශ්‍රී ලංකා පොලීසිය (ල. 3)
 (iii) (අ) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, පොලිස් නිලධාරීන් (ල. 2)
 (ආ) දරුවන්ගේ අයිතීන් හා අදාළ සියලු සේවාවන් උපදේශන සේවාවන් පෙර පාසල් සුබ සාධන සේවාවන් (ල. 4)

03. (i) පෙර සූදානම, කාලසටහනකට වැඩ කිරීම, සවන් දීම ... 45 පිටුව (ල. 3)
 (ii) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 3)
 (iii) i - 3, ii - 5, iii - 4, iv - 2, v - 1 (ල. 5)

04. (i) සන්නිවේදන හැකියාව, ගැටලු විසඳීමේ හැකියාව, මෙහෙයවීමේ හැකියාව (ල. 3)
 (ii) **ඒකාධිපති නායකත්වය**
 පොදු ජනතා අදහස් නොපිළිගැනීම
 වෙනස්වීමට කැමති නොවීම
 තර්ජනය කිරීම, බිය ගැන්වීම
 ඉතා දැඩිව ක්‍රියා කිරීම
 **දූෂිත නායකත්වය**
 වැරදි පූර්වා දර්ශ ප්‍රදර්ශනය කිරීම
 පෞද්ගලිකත්වය වැඩි නැඹුරුවක් දැක්වීම
 සොරකම් කටයුතුවල නියැලීම
 පොදු දේපල අනිසි ලෙස පරිහරණය
 (ල. 8)

05. (i) විවිධ ජනවර්ග ජීවත්වීම, විවිධ ආගම් අදහන ජන කොටස් ජීවත්වීම, විවිධ භාෂා, විවිධ සිරිත් විරිත් (ල. 3)
 (ii) වෙසක් උත්සවය, පොසොන් උත්සවය
 තෛපොංගල්, දීපවාලි
 නත්තල්, පාස්කු උත්සවය (ල. 8)
 රාමසාන් උත්සවය, හජ්ජි උත්සවය (ල. 3)

06. (i) ගංවතුර, නියඟ, ලැව්ගිනි, අකුණු, සුනාමි, භූ චලන
 (ii) වනාන්තර විනාශ කිරීම, වගුරු බිම් ගොඩ කිරීම, පතල් කැණීම, වැලි ගොඩ දැමීම (ල. 3)
 (iii) (අ) පොලීසිය, රෝහල, සාන්ත ජෝන් ගිලන්රථ හමුදාව, ගිනි නිවන ඒකකය (ල. 3)
 (ආ) අධි පාරිභෝජනය, ජල පෝෂක ප්‍රදේශ, ආරක්ෂා නොකිරීම වන ආවරණ ඉවත් කිරීම (ල. 2)

07.

| පහළට | | හරහට | |
|---|---|---|---|
| 1. | රාමසාන් | 2. | මරාති |
| 4. | ඉතාලි | 3. | වැඩබිම |
| 6. | රෝහල | 5. | රතු ඉන්දියානු |
| 7. | කඩොලාන | 9. | රෝමානු කතෝලික |
| 8. | කල් ඉකුත්වීම | 11. | කැපවීම |
| 10. | පහරදීම | | |

(ල. 11)